**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition - Parlimaent of Sri Lanka

2022.10.22

**ආලෝකමත් රටක් උදෙසා දීපවාලීයේදී ප්‍රාර්ථනා කරමු!**

''ආලෝක පේළිය'' යන අර්ථය සහිත දීපවාලි උත්සවය හින්දු බැතිමතුන්ගේ සංස්කෘතික මංගල්‍යයකි.

දෙවියන් වන්දනාමාන කරමින් ආගමික සජ්ඣායනයෙන් හා වන්දනා ස්ථානවල සහ නිවෙස්වල ආලෝකය දල්වමින් දීපාවලී උත්සවය සැමරීම ලොව පුරා සිටින හින්දු බැතිමතුන් විසින් ඉතාමත් භක්තිවන්තව සිදු කරයි.

සුරාසුර සටනින් නපුරත් අයහපතත් පරදවා මානව සමාජයට නිදහස අත්කර දුන් ඓතිහාසික සැමරුමක් ලෙස එය සැලකෙන අතර වර්තමානයේ පවත්නා උවදුරු නැමති නපුර පරාජය කිරීම උදෙසා ද මේ උතුම් දිනයේ ප්‍රාර්ථනා කරමු.

දීපාවලී උත්සවය ජාතික උත්සවයක් ලෙසත්, එය ලොව අඳුර නසා ආලෝකය උදා කරවන්නක් ලෙසත්, අඥානය නැති කොට ඥානය පහළ කරන උත්සවයක් ලෙසත් හින්දු භක්තිකයින් සලකයි.

සංහිඳියාවේ අපේක්ෂා පෙරදැරිව වාර්ගික සංහිඳියාවත් අන්‍යෝන්‍ය අවබෝධයත් ඇති කිරීමෙහිලා මේ අපූරු උත්සවය ඉමහත් පිටිවහලක් සපයයි.

භගවත් ගීතාවත් විෂ්ණු පුරාණයත් විෂ්ණු කවසම් නමැති කෘතියත් විෂ්ණු සකස්වුනාමම් කෘතියත් පෙන්වා දෙන පරිදි දීපාවලී උත්සවයෙන් ජන සමාජයේ මිතුදම් වර්ධනය වී නෑදෑ සබඳකම් තහවුරු වන බව පෙන්වා දෙයි. මේ අනුව බලන කළ පුරාණ කතා පුවත් මෙන්ම හින්දු ධර්මයත් හින්දු දේව කතාත් මිනිසා යහමඟට යොමු කරන යොමු කරවන දිනය දීපාවලි දිනය බවයි.

සියලු දෙනාගේම වෛරය, ක්‍රෝධය ඉවත් වී සැමට මානව සංහිඳියාව පිරි ශ්‍රී ලංකාවක් තුළ නිදහසේ සමඟියෙන් සමාදානයෙන් ජීවත් වීමට දීපාවලිය පිහිටක්ම වේවා.

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

දුරකතන: Telephone: தொலைபேசி: 011 2777253 / 011 2699171
ෆැක්ස්: Fax: தொலைநகல்: 011 2699174
විද්‍යුත් තැපැල: Email: மின்னஞ்சல்: sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7 I இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7 I No 30, Sir Marcus Fernando Mawatha Colombo 7